# අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
## වෘත්තීය අධ්‍යාපන අංශය
## ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය

# පුරප්පාඩු

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය, වෘත්තීය අධ්‍යාපන අංශය යටතේ පවතින ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා ස්ථිර පදනම මත බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

---

01. වඩුකාර්මික - (PL - 3) - තනතුරු 02
02. පෙදරේරු - (PL - 3) - තනතුරු 02
03. සේවාකරු - (PL - 3) - තනතුරු 01
04. කම්මල්කරු - (PL - 3) - තනතුරු 01

**සුදුසුකම්:-**

බාහිර:-

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) හතරවන (04) මට්ටමට නොඅඩු මට්ටමක අදාල තනතුරට අදාල වෘත්තියක ප්‍රවීනතා සහතිකයක් ලබා තිබීම.

**අභ්‍යන්තර:-**

බාහිර අයදුම්කරුවන් සඳහා වන ඉහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

හෝ

අදාල විෂය ක්ෂේත්‍රයක ප්‍රාථමික - ශිල්පීය නොවන (PL 1) සේවා ශ්‍රේණියෙහි අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සමග ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) දෙවන (02) මට්ටමට නොඅඩු මට්ටමක කුසලතාවක් ලබා තිබීම.

**වැටුප් පරිමාණය -**

කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව,
PL 3 - රු. 43,280 - 490x10 - 540x10 - 590x10 - 630x12 - 67,040/-
(මීට අමතරව රජය මගින් අනුමත දීමනා සඳහා හිමිකම් ලබයි.)
2026.01.01 දිනට ගෙවන වැටුප - රු. 40,834.00

**බඳවා ගැනීමේ ක්‍රමය -**

වෘත්තීය පරීක්ෂණයක් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**වයස් සීමාව -**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ.

05. කාර්යාල කාර්ය සහායක - (PL - 1) - තනතුරු 01
06. කම්කරු - (PL - 1) - තනතුරු 05

**සුදුසුකම්:-**

අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටී

**වැටුප් පරිමාණය -**

කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව,
PL 1 - රු. 40,500 - 450x10 - 490x10 - 540x07 - 590x15 - 62,530/-
(මීට අමතරව රජය මගින් අනුමත දීමනා සඳහා හිමිකම් ලබයි.
2026.01.01 දිනට ගෙවන වැටුප - රු. 38,488.00

**බඳවා ගැනීමේ ක්‍රමය -**

සම්මුඛ පරීක්ෂණයක් මගින්

**වයස් සීමාව -**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය.

**තනතුරු සඳහා අදාළ පොදු කොන්දේසි -**

- සියළුම අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.
- මානසික හා කායික වශයෙන් දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීමට සුදුසු විය යුතුය.
- ඉතා යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.
- ඉහත තනතුරුවලට බඳවා ගන්නා බාහිර අයදුම්කරුවන් වසර 03 ක පරිවාස කාලයක් සැපිරිය යුතුය. ඔහු/ඇය එම කාලසීමාව අවසානයේ දී පෙන්වනු ලබන සතුටුදායක කාර්ය සාධනය සහ පැවැත්ම අනුව, තනතුරෙහි ස්ථිර කරනු ඇත. දැනටමත් තනතුරෙහි ස්ථිර කර ඇති අභ්‍යන්තර අයදුම්කරුවන් වසර 01 ක වැඩ බලන කාලසීමාවකට යටත් වනු ඇත.
- ඉහත තනතුරුවලට බඳවා ගැනීම් අදාල තනතුරෙහි ආරම්භක වැටුප් පියවරට වේ.
- සේවක අර්ථසාධක අරමුදල සඳහා වැටුපෙන් 08% ක් අයකර ගනු ලබන අතර ඊට ආයතනයේ දායකත්වය 12% ක් හා සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල සඳහා 3% ක් වේ.

අයදුම්කරුවන් පහත දැක්වෙන ලිපි ලේඛනවල ඡායා පිටපත් ස්වකීය අයදුම්පත සමග අමුණා එවිය යුතුය.
(අ) උප්පැන්න සහතිකය
(ආ) අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික
(ඇ) සේවා පළපුරුද්ද පිළිබඳ සහතික
(ඈ) ජාතික හැඳුනුම්පත

දැනට රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ දෙපාර්තමේන්තුවල සේවය කරන අය තම ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත් එවිය යුතු අතර අයදුම්කරු තෝරා ගන්නා ලද්දේ නම් ඔහු/ඇය සේවයෙන් නිදහස් කල හැකි බවට ආයතන ප්‍රධානියා සහතික කල යුතුය. ඥාතීන් නොවන ඔබ පිළිබඳව විමසිය හැකි දෙදෙනෙකු ඇතුලත්ව සම්පූර්ණ විස්තර සහිත අයදුම්පතක් තමා විසින් සහතික කරන ලද සහතිකවල පිටපත් සමග **2026.06.21 දිනට ප්‍රථම කළමනාකාර - පරිපාලන හා මානව සම්පත්, ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය, අංක 582, ගාලු පාර, ගල්කිස්ස** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලිපි කවරයෙහි ඉහල වම් කෙළවරෙහි අයදුම් කරන තනතුර නිවැරදිව සඳහන් කල යුතුය. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. කෙටි ලැයිස්තුගත කරන ලද අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. අවසාන දිනට පසු ලැබෙන අයදුම්පත් සලකා බලනු නොලැබේ.

බඳවා ගැනීමට කිසිදු ආකාරයකින් බලපෑමක් කිරීම බඳවා ගැනීමට නුසුදුසුකමක් වනු ඇත.

**අධ්‍යක්ෂ - විදුහල්පති**
**ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය**
**අංක 582, ගාලු පාර,**
**ගල්කිස්ස.**